සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය 2011, සයවැනි කලාපය, පිටු 77-92
ISSN 1800-1459

# පාලියෙහි නාම වරනැගීම: කච්චායන හා මොග්ගල්ලායන සම්ප්‍රදාය දෙක ඇසුරින් කෙරෙන විමර්ශනයක්

**මැදගම්පිටියේ විජිතධම්ම හිමි**

*පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.*

**සාරාංශය**

අර්ථ ප්‍රකාශනය පිණිස ප්‍රකෘතීන් විවිධ අර්ථයන්ට බෙදා හැරීම ඉන්දීය භාෂාවල ආවේණික ලක්ෂණයකි. ධාතු ප්‍රකෘති හා ශබ්ද ප්‍රකෘති වශයෙන් ප්‍රකෘතියේ ප්‍රභේද දෙකකි. ධාතු ප්‍රකෘතියක් වරනැගීමෙන් ආඛ්‍යාත පද ද ශබ්ද ප්‍රකෘතියක් වරනැගීමෙන් නාම පද ද නිර්මාණය වෙයි.

පාලියෙහි ශබ්ද ප්‍රකෘතීන්ගේ සංකීර්ණ වීම නිසා නාමයන්හි විවිධත්වයක් දක්නට ලැබේ. විශේෂයෙන් ම ස්වරාන්ත හා හලන්ත වශයෙන් සංස්කෘතයේ දෙපරිදි ව තිබූ නාමය පිළිබඳ අන්ත භේදය පාලියේ දී අභේද්‍යත්වයට පත්ව තිබේ. එනම් සියලු ශබ්ද ස්වරාන්ත බවට පත්ව තිබේ. ඒ හේතුවෙන් නාම වරනැගීමෙහි විවිධත්වයක් නිර්මාණය වී තිබේ .

පාලි ව්‍යාකරණඥයෝ තම රුචියට අනුකූල ව තෝරාගත් ශබ්ද ප්‍රකෘතීන් ආදර්ශ වරනැගීම් සේ ආධුනිකයින්ට ඉදිරිපත් කරන්නට පෙළඹුණහ. <u>කච්චායන</u> හා <u>මොග්ගල්ලායන</u> යනුවෙන් ශ්‍රී ලංකාවේ ඉතා ප්‍රකට පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය දෙකකි. පාලි ව්‍යාකරණ අධ්‍යයනයේ දී අප භාවිත කරනුයේ මෙම සම්ප්‍රදාය දෙකට අයත් මූල ග්‍රන්ථ හෝ පරිවාර ග්‍රන්ථයන් ය. කච්චායන සම්ප්‍රදායය වඩා විස්තරාත්මක ව අධ්‍යයනය කිරීම සඳහා <u>රූපසිද්ධි ව්‍යාකරණය</u> සමීපයෙන් ආශ්‍රය කෙරෙයි. මේ හා සමානව ම මොග්ගල්ලායන සම්පදායය විස්තීර්ණ ව අධ්‍යයනය කරනු පිණිස <u>පයෝගසිද්ධි</u> නම් වූ මොග්ගල්ලායන පරිවාරය භාවිත කෙරෙයි.

මෙම කෘති දෙක ම නාම වරනැගීමේ එනම් නාම සාධනයේ විස්තරාර්ථ විවරණ ද්විතීය කාණ්ඩයේ දී ඉදිරිපත් කර තිබේ. ඒ සඳහා පිළිවෙළින් සූත්‍ර 242 ක් හා 209 ක් යොදාගෙන ඇත. එම සූත්‍රවලින් ස්වකීය ව්‍යාකරණ සම්ප්‍රදායයේ අනන්‍යතාව මතු කරලීමට මෙම ව්‍යාකරණ සම්ප්‍රදාය දෙක ම ක්‍රියාකළ ආකාරය රූපසිද්ධිය හා පයෝගසිද්ධිය මඟින් අපට අවබෝධ කරගත හැකි ය.

**කේන්ද්‍රීය වචන :** රූපසිද්ධිය, පයෝගසිද්ධිය, නාම වරනැගීම, ශබ්ද, නාම

## හැඳින්වීම

පාලි භාෂාවෙහි නාම වරනැගීම පිළිබඳ ව සැලකීමේ දී එහි දක්නට ඇත්තේ ඒකමතික ලක්ෂණ නොවන බව කිව යුතු ය. අර්ථ ප්‍රකාශනය පිණිස ප්‍රකෘතීන් විවිධ අර්ථවලට බෙදා හැර දැක්වීම වරනැගීම ලෙස හැඳින්වේ. විභක්ති ගැන්වීම ලෙස හඳුන්වන්නේ ද එය යි. ධාතු ප්‍රකෘති හා ශබ්ද ප්‍රකෘති යනුවෙන් ප්‍රකෘතියේ ප්‍රභේද දෙකකි. (සිදත්සඟරාව 1942: 15) ධාතු ප්‍රකෘතීන් කාල කාරක ආදියට වෙන් කිරීම ධාතු වරනැගීම නමින් ගැනෙන අතර ශබ්ද ප්‍රකෘතීන් ඒ ඒ අර්ථවලට බෙදා දැක්වීම නාම වරනැගීම ලෙස හැඳින්වේ. මෙහි ඒ ඒ අර්ථ ලෙස සලකනු ලබන්නේ සාමාන්‍යයෙන් විභක්ති ලෙස හඳුන්වනු ලබන පඨමා දුතියා ආදිය යි. ඒවා සප්ත විභක්ති ලෙස ද හඳුන්වයි. ශබ්ද ප්‍රකෘතියේ ලිංගය අනුව එහි වරනැගීම් රටාව වෙනස් වීම ස්වාභාවික ලක්ෂණයකි. ඒ අනුව පුල්ලිංග, ඉත්ථිලිංග

හා නපුංසක ලිංග යන ලිංග තුන ම අනුව නාම වරනඟනු ලබයි. ඇතැම් නාම ලිඟු නො ලබන බවත් ඇතැම් නාම ලිංග තුන ම භජනය කරන බවත් මෙහි දි සඳහන් කළ යුතු ය. එක ම ලිංගය තුළ වුව ද වරනඟනු ලබන නාමයන්හි එක සමාන බවක් දක්නට නැත. ඊට හේතුව ශබ්ද ප්‍රකෘතියේ අන්තය අනුව වරනැඟීම් රටාව වෙනස්වීම යි. පාලියෙහි ස්වරාන්ත ශබ්ද ප්‍රකෘති මිස හලන්ත ප්‍රකෘතින් නොමැති නිසා ඒ ඒ ස්වරයෙන් අන්තවන ශබ්ද ප්‍රකෘතින් අකාරාන්ත, ආකාරාන්තාදි වශයෙන් වෙන් කරනු ලැබේ. මෙහි දී සඳහන් කළ යුතු කරුණක් නම් ඇතැම් ස්වරවලින් අන්ත වන ශබ්දවලට ස්ථිර වශයෙන් ම ලිංගයක් ද නියම වී ඇති බව යි. උදාහරණ ලෙස ආකාරාන්ත හා ඊකාරාන්ත ශබ්ද දැක්විය හැකි ය. ඒවා නියත ව ස්ත්‍රී ලිංග වෙයි. එහෙත් එය වෙනස් වූ තැන් ද නැත්තේ නොවේ. රූපසිද්ධියෙහි දක්වා ඇති ආකාරාන්ත පුල්ලිංග සා ශබ්දය (රූපසිද්ධි 1964: 57) හා ආකාරාන්ත නපුංසක ලිංග අස්සද්ධා ශබ්දය (එම 78) ඊට නිදසුන් ය.

ඒක වචන, බහු වචන යන වචන භේදය අනුව ශබ්ද ප්‍රකෘතියේ සංඛ්‍යාත්මක වෙනස්කම ඇති වේ. මීට අමතර ව සඳහන් කළ යුතු වැදගත් කරුණක් ද වෙයි. එනම්, ඇතැම්විට එක ම අන්තයකින් කෙළවර වන ශබ්ද ප්‍රකෘති වෙන් වෙන් වූ රටා අනුව වරනැගෙන බව යි. උදාහරණ ලෙස අකාරන්ත පුල්ලිංග ශබ්ද ප්‍රකෘතින්හි වරනැගීම දැක්විය හැකි ය. සරලතම වරනැගීම අකාරාන්ත වරනැගීම (Perniola 1958:110) වුවත් එය ඉතා සංකීර්ණ වූවකි. ඊට හේතුව සංස්කෘතයේ හලන්තව තිබූ ආත්මන්, රාජන්, මනස් වැනි ශබ්ද ද අත්ත, රාජ, මන ලෙසින් අකාරාන්ත බවට පත්ව පාලියෙහි භාවිතවීම යි. මේ නිසා ස්වභාව අකාරාන්ත ශබ්ද හා මෙබඳු විශේෂ අකාරාන්ත ශබ්ද වරනැගීමේ දි වෙනස්කම් පෙන්නුම් කරයි. එය අකාරාන්ත වරනැගීමේ සංකීර්ණත්වයට ද කදිම නිදසුනක් වෙයි.

## සාහිත්‍ය විමර්ශනය

රූපසිද්ධිය හා පයෝගසිද්ධිය පිළිබඳ තුලනාත්මක විමර්ශනයක් මෙතෙක් සිදු වී නැත. පරදුව පදුමජෝති, ලේල්වල අරියජෝති යන හිමිවරුන් දෙදෙනා විසින් රූපසිද්ධියේ එන ව්‍යාකරණ කරුණු සිංහලෙන් ඉදිරිපත් කරමින් 1959 දී පළ කරන ලද 'රූපසිද්ධි ප්‍රමෝදනිය' රූපසිද්ධිය ආශ්‍රිත එක ම ද්විතියික මූලාශ්‍රය යි. පයෝගසිද්ධිය සම්බන්ධයෙන් එවැනි එකදු හෝ කෘතියක් රචනා වී නැත.. ඒ හා සම්බන්ධ එකම ලේඛනය වන්නේ 1974 දි කෝදාගොඩ ඤාණාලොක හිමියන් කරන ලද සංස්කරණයෙහි ප්‍රස්තාවනාව යි.

## පර්යේෂණ ගැටලුව

සම්ප්‍රදායාන්තර ව පාලි නාම වරනැගීමෙහි දක්නට ඇති සම විසමතා කවරේ ද? යනු මෙම ලිපියේ පර්යේෂණ ගැටලුව යි.

## පර්යේෂණ අරමුණු

ඓතිහාසික දෘෂ්ටිකෝණයකින් බැලීමේ දී නාම වරනැගීම ඉතා සංකීර්ණ බව ඉහත දක්වන ලද හැඳින්වීමෙන් පැහැදිලි විය. ප්‍රචලිත පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය

දෙකක් වන කච්චායන හා මොග්ගල්ලායන සම්ප්‍රදාය දෙකෙහි නාම සාධනය පිළිබඳ විමර්ශනයක් මෙහි දී සිදු කරන ලදී. වෙසෙසින් ම එහි ලා කච්චායන සම්ප්‍රදායයේ අග්‍රේසර පරිවාරය වන රූපසිද්ධියත් මොග්ගල්ලායන සම්ප්‍රදායයේ අග්‍රේසර පරිවාරය වන පයෝගසිද්ධියත් ආශ්‍රය කෙරිණ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දී මූලික ව භාවිත කරන ලද්දේ තුලනාත්මක අධ්‍යයන ක්‍රමවේදය යි. අදාළ ග්‍රන්ථ දෙකෙහි නාම වරනැගීම හා සම්බන්ධ කරුණු වෙන් වෙන් ව අධ්‍යයනය කොට විශ්ලේෂණය කිරීමෙන් අනතුරු ව තුලනය කිරීම වඩා පහසු විය.

## සාකච්ඡාව:

## නාම සාධනය පිළිබඳ මූලික කරුණු

නාම සාධනයේ දී මෙම ග්‍රන්ථ දෙක විසින් ම දක්වා ඇති මූලික කරුණු කිහිපයකි. සාමාන්‍යයෙන් නාම වරනැගීම සඳහා අවශ්‍ය විභක්ති හා ඊට අදාළ ප්‍රත්‍ය එක හා සමාන ව මෙම කෘති දෙක විසින් ම භාවිත කර ඇත. පහත දැක්වෙන සන්දර්ශක සටහනින් ඒ බව වඩාත් පැහැදිලි වේ.

වගු අංක 01 - විභක්ති හා විභක්ති ප්‍රත්‍යමාලාව

| විභක්ති නාමය | විභක්ති ප්‍රත්‍යය | |
|---|---|---|
| | ඒකවචන | බහුවචන |
| පඨමා | සි | යො |
| ආලපන | සි | යො |
| දුතියා | අං | යො |
| තතියා | නා | හි |
| චතුත්ථී | ස | නං |
| පඤ්චමී | ස්මා | හි |

(මූලාශ්‍රයඃ රූපසිද්ධි (රූසි) 63)

පුල්ලිංග, ඉත්ථිලිංග හා නපුංසක ලිංග යන ලිංග තුනෙහි නාම වරනැගීම වෙන් වෙන්ව සිදුකර ඇත. එහි දී ම තිලිංගික හා අලිංගික නාමයන් ද දක්වා තිබේ. (රූපසිද්ධි (රූසි) 109, පයෝග සිද්ධි (පසි) 92) විශේෂයෙන් ම ඒ ඒ ලිංගයට අයත් නාම වරනගා ඇත්තේ එම නාමවල අන්තය අනුව කරන ලද වර්ගීකරණය අනුව ය. පහත දැක්වෙන සටහන මෙම ග්‍රන්ථ දෙකෙහි නාමයන්හි අන්ත භේදය දක්වන්නකි.

වගු අංක 02 - නාමයන්හි අන්ත භේදය

| ග්‍රන්ථය | ලිංගය | අන්තය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | උ | ආ | ඉ | ඊ | උ | ඌ | ඔ |
| රූපසිද්ධිය | පුල්ලිංග | V | V | V | V | V | V | V |
| | ඉත්ථිලිංග | X | V | V | V | V | V | V |
| | නපුංසක ලිංග | V | V | V | V | V | V | V |
| පයෝගසිද්ධිය | පුල්ලිංග | V | V | V | V | V | V | V |
| | ඉත්ථිලිංග | X | V | V | V | V | V | V |
| | නපුංසක ලිංග | V | X | V | V | V | V | X |

(මූලාශ්‍රයඃ රූසි. නාම කාණ්ඩය හා පසි. ස්‍යාදි කාණ්ඩය)

ලිංගවලට අනුකූල ව ඒ ඒ ස්වරවලින් අවසන් වන ශබ්ද වෙන් වෙන් වූ ඒකක යටතේ කොටස් කර ඒවායේ ශබ්ද රූප සාධනය සූත්‍රානුසාරයෙන් පැහැදිලි කිරීම මෙම කෘති දෙකෙහි ස්වරූපය යි. තම අභිමතය පරිදි මෙම ග්‍රන්ථ කතුවරුන් තෝරාගත් ශබ්දවල රූප සාධනය ඉදිරිපත් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමට පහත දැක්වෙන සටහන වැදගත් වේ.

වගු අංක 03 - පාලි ව්‍යාකරණාගත ශබ්ද මාලාව

| ග්‍රන්ථය | ලිංගය | ශබ්දය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | අ | ආ | ඉ | ඊ | උ | ඌ | ඔ |
| රූපසිද්ධි | පුල්ලිංග | පුරිස,<br>මන,<br>ගුණවන්තු<br>හිමවන්තු,<br>භවන්ත,<br>ගච්ඡන්ත,<br>රාජ,<br>බ්‍රහ්ම,<br>අත්ත,<br>සඛ,<br>ආතුම,<br>පුම, යුව | සා | අග්ගි | දණ්ඩී | භික්ඛු<br>ජන්තු<br>සත්ථු<br>කත්තු<br>පිතු | අභිභූ | ගො |
| | ඉත්ථිලිංග | — | කඤ්ඤා,<br>අම්මා | රත්ති | ඉත්ථී,<br>නදී,<br>මාතුලානී,<br>භික්ඛුනී | යාගු,<br>මාතු | ජම්බු | ගො |
| | නපුංසක ලිංග | චිත්ත,<br>කම්ම,<br>ගුණවන්තු | අස්සද්ධා | අට්ඨි | සුඛකාරී | ආයු | ගොත්‍රභූ | චිත්තගො |

| ග්‍රන්ථය | ලිංගය | ශබ්දය | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | අ | ආ | ඉ | ඊ | උ | ඌ | ඔ |
| පයෝගසිද්ධි | පුල්ලිංග | සුගත,<br>ගුම්බ,<br>එකච්ච,<br>කොධ,<br>දිව, මන,<br>ගච්ඡන්ත<br>භවන්ත,<br>සන්ත,<br>මහන්ත,<br>අස්ම,<br>අද්ධ,<br>බ්‍රහ්ම,<br>අත්ත,<br>සඛ, යුව,<br>පුම | සා | මුනි,<br>අග්ගි,<br>ඉසි,<br>ආදි | දණ්ඩී | භික්ඛු,<br>හෙතු,<br>බහු,<br>වත්ථු,<br>සජ්ජු,<br>පිතු<br>ගුණව<br>න්තු<br>හිමව<br>න්තු | වෙස්සභූ<br>සබ්බඤ්ඤූ | ගො |
| | ඉත්ථිලිංග | — | කඤ්ඤා | මති,<br>රති | දාසී<br>නදී | යාගු,<br>මාතු | ජම්බු | ගො |
| | නපුංසක ලිංග | නපුංසක,<br>එකච්ච,<br>පද,<br>ගච්ඡන්ත | — | අට්ඨී | දණ්ඩී | චක්ඛු | ගොත්‍රභූ | — |

(මූලාශ්‍රයඃ රූසි. නාම කාණ්ඩය හා පසි. ස්‍යාදි කාණ්ඩය)

මෙම සටහනෙන් පහත දැක්වෙන විශේෂ කරුණු ඉදිරිපත් වෙයි.

i) රූපසිද්ධිය අකාරාන්ත පුල්ලිංග ශබ්ද යටතේ පමණක් දක්වා ඇති ගච්ඡන්ත ශබ්දය පයෝගසිද්ධිය අකාරාන්ත නපුංසක ලිංග ශබ්ද යටතේ ද දක්වා තිබේ. ඒ අනුව පයෝගසිද්ධි නාම වරනැගීම තුළ පුල්ලිංග ගච්ඡන්ත ශබ්දයක් හා නපුංසකලිංග ගච්ඡන්ත ශබ්දයක් දක්නට ලැබේ.

ii) එමෙන් ම රූපසිද්ධිය අකාරාන්ත පුල්ලිංග ශබ්ද යටතේ දක්වා ඇති ගුණවන්තු ආදී න්තු භාගාන්ත ශබ්ද පයෝගසිද්ධිය උකාරාන්ත පුල්ලිංග යටතේ දක්වා තිබේ.

iii) රූපසිද්ධිය ආකාරාන්ත නපුංසක ලිංග ශබ්ද සාධනය කෙරෙහි යොමු වී ඇතත් පයෝගසිද්ධිය ඒ සඳහා පෙළඹී නැත.

iv) පඨමා විභක්තියට අයත් එකාරාන්ත ව වරනැගෙන ශබ්දරූප සහිත ගුම්බ හා එකච්ච යන ශබ්ද සාධනය පයෝගසිද්ධිය විසින් සිදුකර ඇත. රූපසිද්ධිය ඒ පිළිබඳ ව අවධානය යොමුකොට නැත.

v) පයෝගසිද්ධිය දණ්ඩී ශබ්දයේ පුල්ලිංග මෙන් ම නපුංසකලිංග වරනැගීම ද දක්වා ඇතත් රූපසිද්ධියේ ඇත්තේ පුල්ලිංග වරනැගීම පමණි.

vi) රූපසිද්ධිය ඔකාරාන්ත නපුංසකලිංග චිත්තගො ශබ්දයක් ඉදිරිපත් කර ඇති නමුත් පයෝගසිද්ධියෙ ඔකාරාන්ත නපුංසකලිංග ශබ්ද දක්නට නැත.

vii) ග්‍රන්ථ දෙකෙහි ම ඔකාරාන්ත ඉත්ථිලිංග ගො ශබ්දය පුල්ලිංගයට සමානව ම දක්වා තිබේ. එහෙත් එහි ශබ්දරූප සාධනයක් ඉදිරිපත් කර නොමැත.

## නාම සාධනයට අදාළ මූලික නීති

නාමපද සාධනය සඳහා වූ නීති මෙම ග්‍රන්ථ දෙකෙහි ම දෙවැනි කාණ්ඩය තුළ ඇතුළත් ය. ඉහත දී පැහැදිලි කළ පරිදි පුල්ලිංග, ඉත්ථිලිංග, නපුංසක ලිංග, තිලිංග හා අලිංග යන ඒකක පස තුළ එම නීති විස්තාරණය වී ඇත. රූපසිද්ධියෙහි නාම කාණ්ඩය තුළ සූත්‍ර 242 ක් ඇති අතර පයෝගසිද්ධියෙහ ඇත්තේ සූත්‍ර 209 කි. ඒ සියල්ල පිළිබඳ වෙන් වෙන් වූ විස්තර සැපයීම වඩා වැදගත් නොවන බැවින් මෙහි දී සුවිශේෂී කරුණු පමණක් විමසා බලනු ලැබේ.

## පුල්ලිංග ශබ්ද සාධනයට අදාළ නීති

1. ආලපන විභක්ති ඒකවචන ප්‍රත්‍යය ඇසුරින් නාම පද සාධනයේ දී ශබ්ද ප්‍රකෘතිය සම්බන්ධ අකාරය ද පිතු, සත්‍ථු ආදි තු ප්‍රත්‍යාන්ත ශබ්දවල අන්තය ද ආකාරයක් බවට පත්වන බව රූපසිද්ධියෙ 72 වන සූත්‍රයේ (අකාරපිතාද්‍යන්තානමා) දැක්වේ. එහෙත් පයෝගසිද්ධිය (2.8) පෙන්වා දී ඇත්තේ අ, ඉ, උ යන අන්තයන් දීර්ඝත්වයට පත්වන ආකාරය යි. එමෙන් ම එලෙස ආකාර බවට පත්වූ පසු අදූරස්ථ පුද්ගලයාගේ කැඳවීමෙහි දී නැවත එය විකල්පයෙන් හ්‍රස්ව වන බව රූපසිද්ධිය දැක්වුවත් (රූසි 73) පයෝගසිද්ධිය ඒ පිළිබඳ ව සඳහන් නො කරයි.

2. තාදර්ථ්‍ය ප්‍රකට කිරීම සඳහා අකාරාන්ත ශබ්දවලින් පරව චතුර්ථී විභක්ති ඒකවචන ප්‍රත්‍යයට ආය යන ආදේශය කළ යුතු බව පයෝගසිද්ධි නාම කාණ්ඩයේ දැක්වෙතත් රූපසිද්ධි නාම කාණ්ඩයෙහි එම නියමය දක්නට නැත. කාරක කාණ්ඩයෙහි විභක්ති ප්‍රයෝග දක්වන ස්ථානයේ දී චතුර්ථීයේ කාරක ප්‍රයෝගයක් (රූසි 295) ලෙස විනා විභක්ති රූපයක් ලෙස රූපසිද්ධිය මෙම ප්‍රත්‍යය ගණනය කර නොමැත.

3. මනෝගණික ශබ්ද පිළිබඳ සංඛ්‍යාත්මක වෙනසක් මෙම කෘතීන්හි දක්නට ඇත. රූපසිද්ධියට අනුව මන ශබ්දය ආදි කොටගත් වය, වය, තෙජ, තප, චෙත, තම, යස, අය, පය, සිර, සර, උර, රහ, අහ යන ශබ්ද 15 මනෝගණයට අයත් වේ. ඒවායින් රහ, අහ යන ශබ්ද දෙක පයෝගසිද්ධිය ප්‍රතික්ෂේප කරයි. ඒ අනුව එහි මනෝගණික ශබ්ද 13 ක් ඇත. අහ ශබ්දය ප්‍රතිපාදනය කළ නොහැකි බැවිනුත් රහ ශබ්දය නිපාතයක් බැවිනුත් ඒවා ඉවත් කළ බව වැඩිදුරටත් එහි සඳහන් වේ. (පසි. 2.34)

   මෙම ගණයට අයත් ශබ්ද සාධනයේ දී ස්මිං, නා (රූසි. 95) ස (රූසි. 97) යන විභක්ති ප්‍රත්‍ය හා ශබ්දය අතර ස කාරාගමයක් ව (රූසි. 96) පිළිවෙළින් ඉහත විභක්ති ප්‍රත්‍යවලට ඉ, ආ හා ඔ යන ආදේශ වන බව රූපසිද්ධි මතය යි. පයෝගසිද්ධිය දක්වා ඇති පරිදි එහි දී සිදුවන්නේ ආගමයක් නොව

ආදේශයකි. ඒ අනුව ස්මිං, ස, නා, ස්මා යන විභක්තිවලට පිළිවෙළින් සි, සො, සා යන ආදේශ වෙයි (පසි. 2.27).

4. භවන්ත ශබ්දය ආලපන විභක්ති ඒක වචනයෙහි වරනැගීමේ දී දක්නට ලැබෙන භො සහ භනෙත යන ශබ්දරූප ආමන්ත්‍රණවාචී නිපාත සේ පයෝගසිද්ධිය හඳුන්වා දෙයි. (පසි. 34) එහෙත් රූපසිද්ධියට අනුව ඒවා නිපාත නොව භවන්ත ශබ්දයට වන ආදේශයන් ය.

භද්දන්ත ශබ්දයේ නිෂ්පත්ති විස්තරය ද එකිනෙකට වෙනස් ව දැක්වේ. පයෝගසිද්ධියට අනුව භද්ද ශබ්දයේ ද කාරය ද්විත්වවීමෙන් භද්දන්ත ශබ්දය නිපැයී තිබේ. (පසි. 34) මේ පිළිබඳ රූපසිද්ධි මතය වී ඇත්තේ භද්දන්ත යනු භදන්ත ශබ්දයේ ආදේශිත රූපයක් යනු යි (රූසි. 111).

5. රාජ ශබ්දයේ ශබ්ද රූප සාධනය දක්වමින් රූපසිද්ධිය යෝජනා කරන සු, නං, හි විභක්තිවල දී වන රාජු යන ආදේශය (රූසි. 117) පයෝගසිද්ධියෙන් අනුමත වී නැත. එහි 2. 45 වැනි සූත්‍රයෙන් ප්‍රකාශ වන්නේ රාජ ශබ්දයෙන් පරව උ෴ යොදාගත යුතු බව යි. එහි දී නිපැයෙන රාජු යන්නට විභක්ති ප්‍රත්‍ය ගන්වා ශබ්දරූප සාධනය කෙරෙයි.

6. හි සහ ස්මිං යන විභක්තීන් පරව ඇතිවිට අත්ත ශබ්දයේ අන්තය අන් බවට පත්වන බව රූපසිද්ධියේ 126 වන සූත්‍රයෙන් නිර්දිෂ්ට ය. එහෙත් මේ පිළිබඳ පයෝගසිද්ධි මතය වී ඇත්තේ සු, හි විභක්තිවලට අයත් ශබ්දරූප සාධනයේ දී අත්ත ශබ්දයෙන් පරව ත් කාරයක් ආගම වන බව යි. (පසි. 2.53)

7. සඛ ශබ්දයේ මුල් විභක්ති දෙකෙහි රූප සාධන නීති අතර ද විශේෂතාවක් දක්නට ඇත. සඛ ශබ්දයෙන් පරවූ යො විභක්තියට ආනො හා නො යන ආදේශ සිදුවන බව මෙම ග්‍රන්‍ථ දෙක ම දක්වයි (රූසි. 131, පසි. 2.59). එහෙත් එම නො ආදේශයෙන් පසුව සඛ ශබ්දයේ අන්තයට ඉකාරයක් එකතු කිරීම පිළිබඳ නියමය පයෝගසිද්ධිය විසින් ඉදිරිපත් කර නැත. උක්ත නීතිය අනුව රූපසිද්ධිය පඨමා හා දුතියා බහු වචනවල දී දක්වා ඇති සඛිනො යන රූපය පයෝගසිද්ධියෙහ දක්නට නොලැබේ.

එමෙන් ම සඛ ශබ්දයේ අන්තයට සිදුවන ආදේශයක් සේ මෙම ග්‍රන්ථ දෙක ම නීතිගත කර ඇති ආර යන ආදේශය පිළිබඳ නියමය ද විශේෂතා ප්‍රකට කරයි. රූපසිද්ධිය සු, නං, අං, හි යන විභක්තිවල දී මෙම ආදේශය සිදුවන බව දක්වන අතර (රූසි.133, 134) පයෝගසිද්ධිය උක්ත විභක්තිවලට අමතරව යො, ස්මා යන විභක්ති දෙකට ද එය නියම කර තිබේ. (පසි.2.16) ඒ අනුව පඨමා හා දුතියා විභක්ති බහු වචනයට සඛාරො යන ශබ්ද රූපයත් පඤ්චමී ඒක වචනයට සඛාරා, සඛාරස්මා වැනි රූපත් එකතු වී ඇත.

8. බහු, කති වැනි ශබ්දවලින් පර වූ නං (චතුත්‍ථී හා ඡට්ඨී බහු වචන) විභක්තියේ දී න් කාරයක් ආගම වීම නීතියක් ලෙස දක්වන පයෝගසිද්ධිය බහුන්නං වැනි පද එම නීතිය හරහා සාධනය කර තිබේ. එහෙත් එවැනි ශබ්ද සාධන නීතියක් රූපසිද්ධියෙන් හමු නොවේ.

9. කුතො (පසි. 2.110) යන සූත්‍රයෙන් පයෝගසිද්ධිය පෙන්වා දී ඇති කූ ප්‍රත්‍යාන්ත ශබ්ද පිළිබඳ නියමය රූපසිද්ධියෙහි නැති සුවිශේෂී ඉගැන්වීමකි. සබ්බඤ්ඤූ, මග්ගඤ්ඤූ, ධම්මඤ්ඤූ, කාලඤ්ඤූ, රත්තඤ්ඤූ, මත්තඤ්ඤූ, කතඤ්ඤූ, තථඤ්ඤූ, විඤ්ඤූ, විදූ යන ශබ්ද කූ ප්‍රත්‍යාන්ත ලෙස නම් කර ඇත. එමෙන් ම වෙදගූ ආදී ශබ්ද රූ ප්‍රත්‍යාන්ත නමින් ද හඳුන්වා ඇත. රූපසිද්ධියෙහි මෙවැනි ශබ්ද සියල්ල රූ ප්‍රත්‍යාන්ත ලෙස ම හඳුන්වයි (පසි. 2.110).

10. ගො ශබ්දය සාධනයේ දී මෙම කෘති දෙක ඉදිරිපත් කර ඇති ව්‍යාකරණ නීතින්හි යම් යම් විශේෂතා දක්නට තිබේ. 2. 111 වැනි සූත්‍රයෙන් පයෝගසිද්ධිය නියම කර ඇති ආකාරයට ග, සි. හි, නං යන විභක්ති හැරුණු විට ඉතිරි විභක්තිවල දී ගො ශබ්දයට ගාව හා ගව යන ආදේශ දෙක වෙයි. (පසි 2.111) එහි දී සිදුවන්නේ සම්පූර්ණ ගො ශබ්දයට මෙම ආදේශ ආරෝපණය වීම යි. මෙම කාර්යය ම ගො ශබ්දයට නියම කරන රූපසිද්ධිය පෙන්වා දෙන්නේ ගො ශබ්දයේ ඔ කාරයට ආව, අව යන ආදේශ සිදුවන ආකාරය යි. (රූසි. 170) එම නියමය සන්ධි කාණ්ඩයේ දී 'ඔ සරෙ ච' (රූසි. 31) යන සූත්‍රයෙන් විහිත කාර්යය ම පුනර්කථනය කිරීමකි.

දුතියා විභක්ති ඒක වචනයට නිර්දේශිත ගාවුං යන පදයේ සාධනය ද මෙබඳු ම ය. මේ සඳහා පයෝගසිද්ධිය නිර්දේශ කර ඇත්තේ ගාවු යන ආදේශය යි (ගාවුම්හි, පසි. 2.112). එහි දී සිදුවන්නේ අං විභක්තිය පරකල්හි ගො ශබ්දයට ගාවු යන ආදේශය වීම යි. එහෙත් රූපසිද්ධියට අනුව එය ගො ශබ්දයට වන සම්පූර්ණ ආදේශයක් නොවේ. එහි 171 වන සූත්‍රයෙන් නිර්දේශකර ඇති පරිදි සිදුවන්නේ ගො ශබ්දයට කළ ආව ආදේශයේ අන්තයට උ කාරයක් වීම යි. එයින් පැහැදිලි වන්නේ පයෝගසිද්ධිය සම්පූර්ණ ගො ශබ්දයට නිර්දේශ කර ඇති ආදේශය රූපසිද්ධිය ශබ්දාන්ත පරිවර්තනයක් සේ පමණක් නිරූපණය කර ඇති බව යි.

රූපසිද්ධියට අනුව ගොණ ශබ්දය නිපැයෙන්නේ ගො ශබ්දයට ගොණ යන ආදේශය වීමෙනි. 172 හා 173 සූත්‍රවලින් ඒ සඳහා බලපාන නියමයන් ඉදිරිපත් කර ඇත. එහෙත් පයෝගසිද්ධියෙ මතය වන්නේ ගොණ ශබ්දය වෙනත් ශබ්දයක් බව යි (පසි. 52).

## ඉත්ථිලිංග ශබ්දරූප සාධනයට අදාළ නීති

1) ආකාරාන්ත ශබ්ද ඉත්ථිලිංගයෙහි ආවේණික ශබ්ද ගණයකි. කඤ්ඤා වැනි ශබ්ද ඊට නිදසුන් ය. එබඳු ශබ්දයන්හි ආලපන විභක්ති ඒක වචන රූප සාධනය පැහැදිලි කරන රූපසිද්ධියේ 178 වන සූත්‍රයට (සතෙ ච) අනුව ආකාරාන්ත ශබ්දවලින් පරවූ ආලපන විභක්ති ඒක වචනයට (ග සංඥයට) එකාරයක් වේ. ඒ අනුව (භොති) කඤ්ඤෙ යනුවෙන් නිර්මාණය කර ඇති ශබ්ද රූපය ආලපන ඒක වචනය සඳහා වරනගා තිබේ. මෙම රූපය පයෝගසිද්ධිය ද පිළිගෙන ඇති අතර ඉන් පරිබාහිර වූ කඤ්ඤා යන ශබ්ද රූපය ද අතිරේක ව නිර්දේශ කර ඇත (පසි. 2.117). එය පයොගසිද්ධියේ ඇති විශේෂ ලක්ෂණයකි.

2) **රත්ති, මාතු** වැනි ඉවර්ණාන්ත හා උවර්ණාන්ත ශබ්දවල පඤ්චමි හා සත්තමි වැනි විභක්තිවල ඒක වචනයෙහි පෙනී සිටින **රත්‍යා, මත්‍යා** වැනි ශබ්දරූප නිර්මාණය පිළිබඳ නියමයන් ද මෙම ග්‍රන්ථ දෙකෙහි විශේෂතා පිළිබිඹු කරයි. <u>රූපසිද්ධිය</u> 184 වැනි සූත්‍රයෙන් නිර්දේශ කර ඇති පරිදි ස්ත්‍රීලිංගයෙහි ඉවර්ණාන්ත හා උවර්ණාන්ත ශබ්දවලින් පරව ඇති පඤ්චමි (ස්මා) හා සත්තමි (ස්මිං) විභක්ති ඒක වචනවලට ආ සහ අං යන ආදේශ දෙක වෙයි. එම ආදේශිතයන් පරව ඇති විට ශබ්දාන්ත ඉවර්ණයට හෝ උවර්ණයට යකාරයක් ආදේශ කළ යුතු බව 185 වැනි සූත්‍රයෙන් නිර්දේශ කර තිබේ. මෙම නියමයට අනුකූල වූ පදසාධනය පහත දැක්වෙන පිළිවෙළට වෙයි.

i) රත්ති + ස්මා
රත්ති + ආ
රත්ත් + ඉ+ ආ
රත්ත් + ය + ආ
රත්‍යා

ii) රත්ති + ස්මිං
රත්ති + අං
රත්ත් + ඉ+ අං
රත්ත් + ය් + අං
රත්‍යං

<u>පයෝගසිද්ධියෙහ</u> මෙම නියමය දක්වා ඇත්තේ 2.122 වැනි සූත්‍රයෙන් ය. (යෙ පස්සිවණ්ණස්ස) ශබ්දාන්තයට යකාරාදේශයක් කිරීම එහි කාර්යය වී නොමැත. එහි 2.118 වැනි සූත්‍රයෙන් නිර්දේශ කළ පරිදි ස්ත්‍රීලිංගයේ අ, ඉ, උ වර්ණාන්තවලින් පරවූ තතියා විභක්තියේ සිට සත්තමි විභක්තිය දක්වා වූ ඒක වචන ප්‍රත්‍යවලට ආදේශ කරනු ලබන ය හෝ යා පරකල්හි ඉවර්ණාන්ත හෝ උවර්ණාන්ත ශබ්දවල අන්ත ස්වරය ලොප් කළ යුතු බව "යෙ පස්සිවණ්ණස්ස" (2.122) යන සූත්‍රයෙන් උගන්වා ඇත. එවිට පදසිද්ධිය සිදුවන්නේ පහත දැක්වෙන ආකාරයට ය.

මති + නා
මති + යා - නා ප්‍රත්‍යයට යා ආදේශය
මත් + යා - ස්වර ලෝපය
මත්‍යා

උක්ත කරුණුවලින් පැහැදිලි වන්නේ එක ම ස්වරූපයක් දරන පද මෙම ග්‍රන්ථ දෙක ක්‍රම දෙකක් ඇසුරින් සාධනය කර ඇති බව යි.

3. පාලියෙහි ස්ත්‍රීලිංග නාම පිළිබඳ ව සැලකීමේ දී දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණ අතර පුරුෂලිංග නාමවලට ස්ත්‍රීවාචී ප්‍රත්‍ය යෙදීම ඉතා වැදගත් ය. ස්ත්‍රීලිංග ශබ්ද සාධන නීති ඉදිරිපත් කරන <u>රූපසිද්ධිය</u> ඊ සහ ඉනී යන ස්ත්‍රීවාචී ප්‍රත්‍ය දෙකින් නිර්මාණය වන ස්ත්‍රීලිංග ශබ්ද ගණනක ශබ්ද සාධන විධීන් ද පෙන්වා දී ඇත.

අ) ඊ ප්‍රත්‍ය යෝගයෙන් තැනෙන ස්ත්‍රීලිංග ශබ්ද
පුථු + ඊ - පුථුවී
ගො + ඊ - ගාවී
මානව + ඊ - මානවී
මහන්ත + ඊ - මහන්තී

ආ) ඉනී ප්‍රත්‍ය යෝගයෙන් තැනෙන ස්ත්‍රීලිංග ශබ්ද

භික්ඛු + ඉනී - භික්ඛුනී

දණ්ඩ + ඉනී - දණ්ඩිනී

මාතුල + ඉනී - මාතුලානී

ගහපති + ඉනී - ගහපතානී

මෙබඳු ශබ්ද සාධනයන් පයෝගසිද්ධියට අනභිමත ය. දාස ශබ්දයට ඊ ප්‍රත්‍යය යොදා රූපසිද්ධි ක්‍රමයට තැනෙන දාසී ශබ්දය පවා පයෝගසිද්ධිය ස්වභාව ස්ත්‍රීලිංග ශබ්දයක් සේ සලකා ඇති බව එය ස්ත්‍රීලිංග ඊකාරාන්ත ශබ්ද කොටසෙහි ලා දක්වා තිබීමෙන් පැහැදිලි වේ.

## නපුංසක ලිංග ශබ්ද සාධනයට අදාළ නීති

නපුංසක ලිංගය නාම වරනැගීමෙහි තෙවැනි ලිංගය සේ පෙනී සිටින නමුත් එය බොහෝදුරට පුල්ලිංගය හා සමාන වෙයි. මෙම ලිංග දෙකෙහි වෙනස රඳා පවත්නේ පඨමා, ආලපන හා දුතියා යන විභක්තිවල දී පමණි. මෙම ලක්ෂණය රූපසිද්ධි පයෝගසිද්ධි යන කෘති දෙකට ම පොදු ය. එහෙත් ඊට අදාළ ශබ්දරූප සාධනයට අදාළ නීතිවල යම් විශේෂතා ද ඇත.

1. පයෝගසිද්ධියෙහ ඇති පදසා, පදසි වැනි ශබ්දරූප සාධනයට අදාළ නියමයන් රූපසිද්ධියෙහි දක්නට නොමැත. පද, බිල වැනි ශබ්දවල තතියා හා සත්තමී විභක්ති ඒක වචනයේ දී විභක්ති ප්‍රත්‍යයට සා, සි යන ආදේශ දෙක සිදුවන බව පයෝගසිද්ධියේ 2.129, 130 යන සූත්‍රවලින් ප්‍රකාශ වේ. රූපසිද්ධියෙහි මෙබඳු රූපවලට අදාළ නීති පෙළගැස්වී නැතත් ථාම ශබ්දයේ තතියා විභක්ති ඒක වචනයේ විකල්ප රූපයක් සේ ථාමසා යන්න ඉදිරිපත් වෙයි. (රූසි. 77)

2. නපුංසක ලිංගයට අදාළ ව ඇතැම් ශබ්ද පිළිබඳ ව රූපසිද්ධිය දක්වා ඇති නියමයන් පයෝගසිද්ධියෙ දක්නට නැත. න්තු භාගාන්ත (ගුණවන්තු වැනි) හා ආකාරාන්ත (අස්සද්ධා වැනි) නපුංසක ලිංග ශබ්ද පිළිබඳව රූපසිද්ධිය දක්වා ඇති නියමයන් කිසිවක් පයෝගසිද්ධියෙහ ඇතුළත්ව නැත. එමෙන් ම පයෝගසිද්ධිය නපුංසකලිංග ඊකාරාන්ත ගණයට ද ඇතුළත් කර ඇති දණ්ඩී ශබ්දය රූපසිද්ධිය පුල්ලිංගය යටතේ පමණක් දැක්වීම ද සුවිශේෂී ය.

## තිලිංගික නාම සාධනයට අදාළ නීති

නපුංසකලිංග නාම සාධනය පිළිබඳ නියමයන්ට පසු රූපසිද්ධිය "අථ සබ්බනාමානි වුච්චනෙත" යනුවෙන් ආරම්භ කර "තිලිංගං නිට්ඨිතං" යනුවෙන් අවසන් කර ඇති කොටස තුළ තිලිංගික නාම සාධනයට අදාළ නීති ඉදිරිපත්ව ඇත. පයෝගසිද්ධිය ද එවැනි ම ආරම්භයක් ඇතිව "අථ සබ්බාදීනං රූපනයො නිදස්සියතෙ" යනුවෙන් ශබ්ද සාධන නීති කථනයක් ආරම්භ කර ඇතත් රූපසිද්ධිය මෙන් එහි සමාප්තියක් දක්වා නැත. එහෙත් "තුම්හාම්හ සද්දා අලිංගා ...." යනුවෙන් ඇරඹෙන අලිංගික ශබ්ද සේ ගැනෙන **තුම්හ, අම්හ** ශබ්ද සාධනය පිළිබඳ නියම කථනයට පෙර සබ්බනාම පිළිබඳ නීති කථනය අවසන් වියයුතු වේ. පයෝගසිද්ධිය මෙහි දී තිලිංගික යන නාමය භාවිත කර නැතත් රූපසිද්ධිය මෙන් සබ්බනාම යන්න භාවිත කර ඇති නිසා එම කොටස සබ්බනාම සේ හඳුනාගැනීම වඩා සුදුසු ය.

මෙම ග්‍රන්ථ දෙකෙහි සබ්බනාම සාධනය සඳහා ඉදිරිපත් කළ නියමයන් විමසීමට පෙර ඒවාහි නිරූපිත සබ්බනාම පිළිබඳ සංක්ෂිප්ත සටහනක් තැබීම සුදුසු ය. රූපසිද්ධියෙහ සබ්බනාම යටතට එකතු කර ඇති ශබ්ද සංඛ්‍යාව 27 කි. ඒවා පහත දැක්වෙන පරිදි පෙළ ගැසී ඇත.

සබ්බ, කතර, කතම, උභය, ඉතර, අඤ්ඤ, අඤ්ඤතර, අඤ්ඤතම, පුබ්බ, පර, අපර,

දක්ඛිණ, උත්තර, අධර, ය, ත, එත, ඉම, අමු, කිං, එක, උභ, ද්වි, ති, චතු, තුම්හ, අම්හ

පයෝගසිද්ධියෙහි ඇති සබ්බනාම ගණන 24 කි. ඒවා මෙසේය.

සබ්බ, කතම, උභය, ඉතර, අඤ්ඤ, අඤ්ඤතර, අඤ්ඤතම, පුබ්බ, පර, අපර,

දක්ඛිණ, උත්තර, අධර, ය, ත්‍ය, ත, එත, ඉම, අමු, කිං, එක, තුම්හ, අම්හ

මෙම සබ්බනාම පෙළගැස්වීම් විමසිලිමත් ව අධ්‍යයනය කළ කල්හි ඒ සියල්ල පහත දැක්වෙන පරිදි වර්ග කළ හැකිය.

i) පුරුෂ නිදර්ශක සර්වනාම (අම්හ, තුම්හ, ත)
ii) නිර්දේශාර්ථවාචී සර්වනාම (ඉම, අමු, එත)
iii) අපේක්ෂිතාර්ථවාචී සර්වනාම (ය)
iv) ප්‍රශ්නවාචී සර්වනාම (කිං, කතර, කතම )
v) විශේෂණ ස්වරූපී සර්වනාම (සබ්බ, උභය, ඉතර, අඤ්ඤ, අඤ්ඤතර, අඤ්ඤතම, පුබ්බ, පර, අපර, දක්ඛිණ, උත්තර, අධර, ත්‍ය)
vi) සංඛ්‍යාවාචී සර්වනාම (එක, උභ, ද්වි, ති, චතු)

සර්වනාම සත්විස්ස පෙළ ගැස් වූ රූපසිද්ධිය ඒ සියල්ල සර්වනාම වන බැවින් ත්‍රිලිංගික බැව් ද ප්‍රකාශ කරයි. (තානි සබ්බනාමත්තා තිලිංගානි) එයින් ගම්‍යවන්නේ එම පෙළගැස්වීමට අදාළ සියලු ශබ්ද ලිංග තුනෙහි ම වරනැගෙන බව යි. රූපසිද්ධියේ එන මෙම පිළිගැනීමට අනුකූලව **තුම්හ, අම්හ** යන

ශබ්දයන් විග්‍රහ කිරීම ගැටලුකාරී බව ද මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතුය. තිලිංග සබ්බනාම යටතේ පළමුව ඉදිරිපත් කළ මෙම ශබ්ද දෙක නැවත අලිංග නාම යටතේ ද නීතිගත කර තිබීම ඊට හේතුව යි. (අථාලිංගෙසු නාමෙසු තුම්හාම්හසද්දා වුච්චන්තෙ.) එහෙත් මෙබඳු ගැටලු නිරාකරණය කරමින් රූපසිද්ධිය දක්වන තුම්හ, අම්හ ශබ්ද අලිංගික බැවින් ත්‍රිවිධ ලිංගයෙහි සමාන රූප ඇත යන අදහස ද සැලකිල්ලට භාජනය කළ යුතු වේ. නාමයට ලිංගයක් නැතිනම් එය තුන් ලිඟුවෙහි සමාන රූප ලබන්නේ කෙසේ ද යනු මෙහි දී පැන නගින ගැටලුවකි. රූපසිද්ධියට පමණක් නොව මෙය පයෝගසිද්ධියට ද සාධාරණ ය. එහි යම් විශේෂතාවක් ඇත්තේ නම් එය මෙම ශබ්ද දෙක අලිංගික ලෙස මිස ත්‍රිලිංගික ලෙස ගණනය කර නොතිබීම යි. නැවත මෙම සබ්බනාම පෙළගැසීම් දෙක සසඳා බැලීමේ දී පහත දැක්වෙන නිරීක්ෂණ සාධනය වේ.

i) මෙම කෘති දෙකෙහි සබ්බනාම පිළිබඳ සංඛ්‍යාත්මක වෙනසක් ඇත.

ii) රූපසිද්ධියෙ එන උභ, ද්වි, ති, චතු ශබ්ද පයෝගසිද්ධියේ නැත.

iii) ත්‍ය ශබ්දය පයෝගසිද්ධියට පමණක් ආවේණික වූ සර්වනාමයකි.

මෙම නිරීක්ෂණවලින් දෙවැන්න හා තෙවැන්න විමසිලිමත්ව අධ්‍යයනය කළයුතු වෙයි. රූපසිද්ධිය සබ්බනාම සේ හඳුන්වා ඇති උභ, ද්වි, ත, හා චතු යන ශබ්ද පයෝගසිද්ධිය විසින් සබ්බනාම සේ සලකා නොමැත්තේ ඒවා අලිංගික නාම ගණයට අයත් කර ඇති බැවිනි. "තුම්හ අම්හ සද්දා අලිංගා තථා උභ කති ද්වි සද්දා පඤ්චාදයො අට්ඨාරසන්තා ච" (පසි. 60) යන ප්‍රකාශනය ඊට සාධක සපයයි. මෙයින් ප්‍රකාශ වන්නේ තුම්හ අම්හ යන පුරුෂවාචී ශබ්ද හා සංඛ්‍යාවාචී ශබ්ද අලිංගික නාම සේ හැඳින්වෙන බව යි. ඒ අනුව පැහැදිලි වන්නේ උභ, ද්වි, ති, චතු ශබ්දයන්හි ලිංග නිශ්චය පිළිබඳ මෙම ග්‍රන්ථ දෙකෙහි ම සමාන අදහස් නැති බව යි.

ත්‍ය ශබ්දය කච්චායනයෙහ සර්වනාමයක් සේ දක්වා නැතත් "ඛිඩ්ඩා පණිහිතං ත්‍යාසු රති ත්‍යාසු පතිට්ඨිතා" ආදී වශයෙන් පෙළෙහි දක්නට ලැබෙන බැවින් තමන් එය සර්වනාම ගණයෙහි ලා සංග්‍රහ කළ බව පයෝගසිද්ධි මතය යි (පසි. 60). රූපසිද්ධි-පයෝගසිද්ධි දෙකෙහි සර්වනාමවලට අදාළ නියමයන් පිළිබඳ තුලනයේ දී පහත කරුණු ස්ඵුට වේ.

1. සබ්බා ශබ්දයෙහි චතුර්ථී, ෂට්ඨී ඒක වචනයෙහි ඇති සබ්බස්සා යන රූපය සාධනය කිරීමේ නීතිය යම් වෙනස්කමක් ඇත්තකි. රූපසිද්ධියෙ 206 වැනි සූත්‍රයට (සංසාස්වෙකවචනෙසු ච) අනුව ස විභක්තියට කරනු ලබන සා යන ආදේශය පරව ඇති විට ශබ්දප්‍රකෘතියෙන් පසු ස කාරයක් ආගම වේ. ඒ අනුව සබ්බස්සා යන පදයෙහි මධ්‍යයේ ඇති ස කාරය ආගමයකින් පැමිණියක් සේ වටහාගත යුතු වේ. එහෙත් පයෝගසිද්ධියට අනුව එය ආගමයක් නොව ආදේශයකි. 2.135 වන පයෝගසිද්ධි සූත්‍රයට අනුව සබ්බා ආදී ආකාරාන්ත ශබ්දවලින් පරවූ ස විභක්තියට ස්ස යන ආදේශය වේ. ඒ අනුව සබ්බස්සා යන පදයෙහි අන්තය ආදේශයක් සේ වටහාගත යුතු ය. උක්ත කරුණුවලින් පැහැදිලි වන්නේ රූපසිද්ධිය අදියර කිහිපයකින් සාධනය කළ මෙම පදය පයෝගසිද්ධිය එක් අදියරකින් පමණක් සාධනය කර ඇති බව යි.

2 **ති, චතු** ශබ්දවල ස්ත්‍රීලිංග වරනැගීමෙහි චතුත්ථී, ඡට්ඨී විභක්තිවල බහු වචන රූප සාධනය කර ඇති ආකාරයේ ද වෙනසක් දක්නට ඇත. 2. 193 වැනි සූත්‍රයෙන් පයෝගසිද්ධිය පෙන්වා දී ඇත්තේ **ති, චතු** ශබ්දවලට නං විභක්තියේ දී තිස්ස, චතස්ස යන ආදේශ වන බව යි. එහෙත් රූපසිද්ධියට අනුව මෙහි දී සිදුවන්නේ ආගමයකි. ති, චතු ශබ්දවලින් පරව නං විභක්තිය යෙදෙන විට ඒ අතරට ස්ස ආගමය වේ යනු එහි නියමය යි (රූසි. 90). ඉන්පසු වෙනත් නීතින් ද බලපා **තිස්සන්නං, චතස්සන්නං** යන පද නිර්මාණය වේ.

## අලිංගික ශබ්ද සාධනයට අදාළ නීති

රූපසිද්ධිය අලිංග යන නමිනුත් පයෝගසිද්ධිය අලිංග හෝ අසංඛ්‍ය (පසි. 82) යන නමිනුත් හඳුන්වා ඇති නාම මෙහි දී පොදුවේ අලිංගික නාම ලෙස සලකනු ලැබේ. රූපසිද්ධියට අනුව අලිංගික නාම වර්ග දෙකකි.

1. අලිංගික සබ්බනාම  2. අව්‍ය ශබ්ද වශයෙනි.

තිලිංගික සබ්බනාමවලට පසු 'අථාලිංගෙසු නාමෙසු තුම්හාම්හසද්දා වුච්චන්තෙ' යනුවෙන් ආරම්භ කළ අලිංග නාම සංඛ්‍යාත තුම්හ, අම්හ ශබ්ද පිළිබඳ ලක්ෂණ කථනය නිමා කිරීම පිණිස රූපසිද්ධිය භාවිත කර ඇත්තේ 'අලිංග සබ්බනාමං' යන වැකිය යි. එම කොටස තුළ උක්ත ශබ්ද දෙකත් පඤ්ච ශබ්දයේ පටන් **අට්ඨාදස** ශබ්දය දක්වා වූ ශබ්දත් **කති** ශබ්දයත් විවරණය වී ඇත. (රූසි. 95) එහෙයින් අලිංග සබ්බනාම යනු ඒ සියලු ශබ්දයන් ය.

උපසර්ග හා නිපාත පිළිබඳ විස්තර කථනය ආරම්භ කිරීමේ දී රූපසිද්ධිය භාවිත කර ඇති "අථාලිංගසංඛ්‍යා විභත්ති භෙදා උපසග්ග නිපාතා වුච්චන්තෙ" (රූසි. 95) යන වැකියෙන් ප්‍රකාශ වන්නේ උපසර්ග නිපාත දෙක අලිංග. අසංඛ්‍ය, අවිභක්ති යන ලක්ෂණවලින් යුතු බව යි. එහෙයින් උපසර්ග හා නිපාත ද අලිංගික ශබ්ද සේ ගණනය කරනු ලැබේ.

අලිංග නාම යන්න පයෝගසිද්ධියට අභිමත වුවත් අලිංග සබ්බනාම යන්න අනභිමත ය. එහෙත් රූපසිද්ධිය ඒ නාමය යටතේ යමක් ඉදිරිපත් කරන ලද නම් එය පයෝගසිද්ධිය ද ඉදිරිපත් කර තිබේ. එහෙත් ඒ අතර ඇති වෙනස නම් රූපසිද්ධිය අලිංගික නාම සේ නොදැක්වූ උභ, ද්වි යන ශබ්ද දෙක මෙහි දක්වා තිබීම පමණි.

උපසර්ග හා නිපාත දැක්වීමේ දී පයෝගසිද්ධිය අලිංග යන්න භාවිත කර නැතත් ඊට පර්යාය වශයෙන් භාවිත කළ අසංඛ්‍ය යන්න 'අථාසංඛ්‍යමුච්චතෙ' යන වැකියේ දී දක්නට ලැබේ. ඊට අමතරව අබ්‍යය යන්න ද යොදා ගෙන ඇත. (පසි. 82)

උක්ත අලිංගික සබ්බනාම හා අව්‍ය ශබ්ද පිළිබඳ ව රූපසිද්ධිය හා පයෝගසිද්ධිය ඉදිරිපත් කළ ව්‍යාකරණ නීති පිළිබඳ විශේෂ කරුණු පහත දැක්වේ.

1 **තුම්හ** සහ **අම්හ** ශබ්ද සාධනය සම්බන්ධ විභක්ති ද්වයක වෙනස හැරුණු විට සැලකිය යුතු වෙනසක් මෙම ග්‍රන්ථ දෙකෙහි දක්නට නැත. තුම්හ

ශබ්දයේ පඤ්චමී ඒක වචනය සඳහා 'ස්මාම්හි ත්වම්හා' (2.170) යන සූත්‍රයෙන් පයෝගසිද්ධිය යෝජනා කර ඇති ත්වම්හා යන රූපයේ සාධන විධියක් රූපසිද්ධියේ නැත. එහි ඇත්තේ තයා වැනි ආදේශිත රූප පමණකි. මෙහි දී පයෝගසිද්ධිය අනුගමනය කර ඇත්තේ පඨමා විභක්ති ඒක වචනයේ දී තුම්හ ශබ්දයට ආදේශ කළ (පසි. 2.160) ත්වං යන්නෙහි විභක්ති රහිත කොටසට පඤ්චමී ඒක වචනයේ ආදේශිත ප්‍රත්‍යයක් වන (පසි. 2.73) ම්හා යන්න එකතු කිරීමකි. එහෙත් අම්හ, තුම්හ ශබ්ද දෙක ඇතුළුව න්තු භාගාන්ත ශබ්දවලත් රාජ, බ්‍රහ්ම, අත්ත, සඛ, සත්‍ථු, පිතු යන ශබ්දවලත් පඤ්චමී විභක්ති ඒක වචනය තතියා විභක්ති ඒක වචනය මෙන් තැබිය යුතු බවත් එහි දී අතිදේශයක් නොවන බවත් රූපසිද්ධි මතය යි. (රූසි. 120)

අම්හ ශබ්දයේ සත්තමී බහුවචනය සඳහා පයෝගසිද්ධිය යෝජනා කර ඇති අස්මාසු යන රූපය සාධනය කරනු පිණිස දක්වා ඇති සු විභක්තිය පරකල්හි අම්හ ශබ්දයට අස්මා යන ආදේශය වේ (සුම්හාම්හස්සාස්මා 2.171) යන නීතිය රූපසිද්ධියට සාධාරණ නොවන්නකි. තුම්හ ශබ්දයෙන් පරව සු ප්‍රත්‍යය යොදා සාධනය කරන තුම්හෙසු යන රූපය ම ඊට ආවේණික වෙයි.

2 රූපසිද්ධිය අලිංගික සබ්බනාම යටතේත් පයෝගසිද්ධිය සංඛ්‍යා ශබ්ද නමින් වෙන් වූ ඒකකයක් යටතේත් සාධනය කර ඇති සංඛ්‍යාවාචී ශබ්ද ගණයක් ද වේ. පයෝගසිද්ධිය අක්ඛෝහිනී ශබ්දය අවසන් කර ඇති සියලු සංඛ්‍යා විශ්ලේෂණය කර ඇති මුත් රූපසිද්ධිය අට්ඨාදස ශබ්දය අවසන්කොට ඇති ශබ්දවලට එය සීමාකර තිබේ.

රූපසිද්ධියේ 253 වැනි සූත්‍රයෙන් නිර්දේශිත පරිදි ද්වි, එක, අට්ඨ ශබ්දවල අන්තය සංඛ්‍යාවාචී ශබ්දයක් පරව ඇතිවිට ආ කාරයක් බවට පත් වෙයි. (ද්වෙකට්ඨානමාකාරො වා, රූසි. 253 ) එම නීතිය යටතේ ද්වාදස, ඒකාදස, අට්ඨාදස වැනි පද නිෂ්පාදනය වේ. පයෝගසිද්ධිය ද මෙම නීතිය එපරිද්දෙන් ම යෝජනා කර ඇතත් එය දස ශබ්දය පරව ඇති එක හා අට්ඨ ශබ්දවලට පමණක් සීමා කර තිබේ. (පසි. 2.198)

තෙළස, තෙරස යන ශබ්ද දෙක සාධනයේ දී රූපසිද්ධි මතය වී ඇත්තේ සංඛ්‍යාවල ඇති දකාර රකාරවලට ලකාර ආදේශය වන බව යි. (ලදරානං, රූසි. 258) එහි කවර සංඛ්‍යාවල ද යන්න සඳහන් නොවෙතත් පයෝගසිද්ධිය ති හා ඡ ශබ්දවලින් පර වූ දස ශබ්දයේ දකාරයට පමණක් සීමාකර පැහැදිලිව දක්වා තිබේ. (ඡතීහි ළො ච, පසි. 2.203) අනෙක් අතට රූපසිද්ධි නියමයෙන් ද හා ර යන අකුරුවලට ල වන බව හැඟවෙතත් පයෝගසිද්ධි නියමයෙන් හැඟවෙන්නේ දස ශබ්දයේ දකාරයට ළ හෝ ර වන ආකාරය යි. රූපසිද්ධිය ල, ළ දෙකෙහි වෙනසක් නොදක්වතත් පයෝගසිද්ධිය නියම කර ඇත්තේ ළකාර ආදේශය ම පමණි.

## නිගමනය

රූපසිද්ධිය හා පයෝගසිද්ධිය ඇසුරෙන් කරන ලද පාලියෙහි නාම වරනැගීම පිළිබඳ මෙම විමර්ශනයෙන් පැහැදිලි වන්නේ ප්‍රකට පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය

දෙකක් ලෙස කච්චායන හා මොග්ගල්ලායන සම්ප්‍රදාය දෙක ඉතා සියුම් ලෙස තම ව්‍යාකරණ සම්ප්‍රදායයේ අනන්‍යතාව විදහා පෑමට යත්න දරා ඇති ආකාරය යි.

කෙටි යෙදුම්

පසි : පයෝගසිද්ධි

රූසි : රූපසිද්ධි

## පරිශීලිත මූලාශ්‍රය


*පයෝගසිද්ධි* (1974) ඤාණාලෝක, කෝදාගොඩ (සංස්) කොළඹ, ඩබ්.ඊ.බැස්ටියන් සහ සමාගම.

*මහාරූපසිද්ධි* (1964) පඤ්ඤාසේඛර, කළුකොඳයාවේ (සංස්) කොළඹ, ගුණසේන මුද්‍රණාලය.

*මහාරූපසිද්ධි සන්නය* (1927) සුමංගල, මැදගම හා ධම්මරතන, බද්දේගම (සංස්) පෑලියගොඩ, සත්‍යසමුච්චය යන්ත්‍රාලය.

*මොග්ගල්ලායන ව්‍යාකරණය* (1919) දෙවමිත්ත, හෙය්යන්තුඩුවේ (සංස්) කොළඹ, ලංකාභිනව මුද්‍රණාලය.

*මෞද්ගල්‍යායන ව්‍යාකරණය හා විරිත සන්‍යය* (1927) ධර්මාරාම, රත්මලානේ (සංස්) පෑලියගොඩ, සත්‍ය සමුච්චය යන්ත්‍රාලය.

*සිදත්සඟරාව* (1942) ධර්මාරාම, රත්මලානේ (සංස්) පෑලියගොඩ, සත්‍යසමුච්චය මුද්‍රණාලය.

උපාධ්‍යාය, භරතසිංහ (2003) *පාලි සාහිත්‍යයේ ඉතිහාසය*, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රාහුල, කහටපිටියේ (1996) *ශ්‍රී ලංකාවේ පාලි ව්‍යාකරණ සම්ප්‍රදාය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්*, හොරණ, විද්‍යාරත්න මුද්‍රණාලය.

De Alwis, James (1867) *An Introduction to Kacchayanas' Grammar of Pali Language*, Colombo.

Ghatage AM (1962) *Historical Linguistics and Indo-Aryan Languages*, University of Bombay, Bombay.

Geiger, W (1957) *Pali Language and Literature*, (2nd edition) Calcutta.

Perniola, V (1997) *A Grammar of the Pali Language*, London, Pali Text Society.

Sen, Sukumar (1953) *Historical Syntax of Middle Indo-Aryan*, Calcutta, Linguistic Society of India.

Sen, Sukumar. (1960) *A Comparative Grammar of Middle Indo-Aryan Languages*, Poone, Linguistic Society of India.